## 20

# දුනුමාලේ බිසෝබණ්ඩාර දේව සංකල්පය

**ජී. ජී. ජී. කේ. සෙනරත්** [1]
HU/2012/0697

මෙම පර්යේෂණ පත්‍රිකාවේ මූලික අරමුණ වන්නේ සියනෑ කෝරළයේ පුදනු ලබන ප්‍රාදේශීය දෙවි කෙනෙක් වන දුනුමාලේ බිසෝබණ්ඩාර දෙවියන් පිළිබඳ සංකල්පය විග්‍රහ කිරීමයි. මෙම දේව සංකල්පය ගොඩනැගුණු ආකාරය, පුද ලැබීමට හේතුව කුමක්ද යන්න විග්‍රහ කිරීම ද අරමුණකි. මෙම දේව සංකල්පය ඇතිවීමට හේතු වූ පුරාවෘත්තයක් ද ජනයා අතර පවතී. මෙම සංකල්පය අලවල, දේවීන්පැන්නැල්ල, මහකන්ද, ඇතාඋඩකන්ද, දුනුමාල ආශ්‍රිත ප්‍රදේශ පුරා පැතිර පවතී. දුනුමාල නම් ග්‍රාමයේ මෙම දෙවියන් වෙනුවෙන් දේවාලයක් ඉදිකොට දෙවියන් උදෙසා පුද පූජා සිදු කරනු ලබයි. එසේම ජනයා විසින් වාර්ෂික මංගල්‍ය පවත්වන අතර සෑම සුබ අසුබ කටයුත්තකදී ම දුනුමාලේ දෙවියන් ප්‍රමුඛ කොට ගැනීම සුවිශේෂ වේ. මෙම දුනුමාලේ බිසෝබණ්ඩාර දේව සංකල්පය සමඟ බැඳි චාරිත්‍ර-වාරිත්‍ර මෙන්ම හාස්කම් ද ගැමියා අතර කතා බහට ලක්වන අතර දඬුවම් ලැබූ අවස්ථා ද දක්නට තිබේ. මේ ආකාරය ට එම දෙවියන් පිළිබඳ ජනයා තුළ පවතින සංකල්පය ක්ෂේත්‍ර ගවේෂණය මඟින් ලබාගන්නා දත්ත ඇසුරින් විශ්ලේෂණය කිරීමට අපේක්ෂිත ය.

ප්‍රමුඛ පදඃ දුනුමාලේ බිසෝබණ්ඩාර දෙවි, දේව සංකල්පය, ජන ජීවිතය, සියනෑ කෝරළය

*1 ප්‍රාසංගික කලා (විශේෂවේදී) දෙවන වසර*